# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2107/22 - 2019 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2019.01.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KUDS/LND/01/ACQ/03.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/8/2012/PC/68.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

**වටප්පිටිය සති පොළ සඳහා - කුරුවිට ප්‍රාදේශීය සභාවට**
සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරකඩුව ග්‍රාම නිලධාරි වසමේ පත්බේරිය ගමේ පිහිටි රත්නපුර මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක ර/325 හා 2018/11/06 දරන පිඹුරේ, කැබලි අංක 01 ලෙස සළකුණු කර ඇති ප්‍රමාණය පිළිවෙලින් හෙක්ටයාර් 0.2351 ක් වන ඉඩම් කොටස.

**කැබලි අංකය** - 01
ඉඩමේ නම: පුස්සැල්ලවත්ත; මුල් හිමිකම: සී/ස පුස්සැල්ලාව වැවිලි සමාගම, 590, ගාලු පාර, කොළඹ 03. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල; වර්තමාන හිමිකම් කියන්නා: රජය; ප්‍රමාණයඃ හෙක්ටයාර් 0.2351.

ඉහත සඳහන් ඉඩමේ/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 09.00 ට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2019 පෙබරවාරි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

දිලිනි ධර්මදාස,
ප්‍රාදේශීය ලේකම්,
කුරුවිට.

2019 ජනවාරි මස 18 වැනි දින,
කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

02 - 242